# 5 ශ්‍රේණිය

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## 04. අප අවට සතුන් - (Animals around us)



සැකසුම - ගිරිඋල්ල මහින්ද ප්‍රා.වි.

සතුන් අප මෙන්ම පරිසරයට හිමිකම් කියන අතර පරිසරයේ නිදහස්ව ජීවත් වීමේ අයිතිය ඔවුන්ටද ඇත. මිනිසා හා සතුන් අතර පවත්නා අන්තර් සබඳතාව පරිසරයේ සමතුලිතතාව කෙරෙහි බලපායි.

අප අවට පරිසරයේ ජීවත් වෙන සතුන් පහත කාණ්ඩ යටතේ වර්ග කළ හැක.

- ක්ෂීරපායී සතුන්



බල්ලා



රිළවා



තල්මසා



ගොරිල්ලා



මුවා



ඩොල්පින්

- **පක්ෂීන්**



කහ කුරුල්ලා



බකමූණා



පැස්බරා



ගිරවා



හංසයා




රාජාලියා


- **මත්ස්‍යයින්**











## ➢ උභය ජීවීන්



මැඩියා



ගෙම්බා



සලමන්දරා

## ➢ උරගයින්



කිඹුලා



ඉබ්බා



නයා



පොළභා

## සතුන්ගේ පැවැත්ම සඳහා ඉවහල් වන ශරීර ලක්ෂණ

- පක්ෂීන් - පියැඹීම සඳහා පිහාටු ,පියාපත් තිබීම.
- මත්ස්‍යයන් - පිහිනීම සඳහා වරල් තිබීම.
- පූසා - ගොදුරු සොයාගැනීම සඳහා රැවුළු කෙඳි තිබීම.
- හූනා - පෘෂ්ඨයකට ඇලී සිටීම සඳහා විශේෂ පාද සහිත වීම.
- කටුස්සා - ආරක්ෂාව පිණිස සමේ වර්ණය වෙනස් කිරීම.
- හැකරැල්ලා - ආරක්ෂාව සඳහා ශරීරය රෝදයක් සේ හකුළුවා ගැනීම.
- ඉබ්බා - ආරක්ෂාව සඳහා තම ශරීරය කටුව තුළට ගැනීම.

## සතුන් මගින් මිනිසාට ලැබෙන දේ

- ආහාර ලබා දීම.
- ආර්ථික වාසි ලබා දීම.
- ආරක්ෂාව සැපයීම.
- ආරක්ෂක සේවා සඳහා උදවු කිරීම.
- පරිසරය අලංකාර කිරීම.
- මානසික සුවය ලබා දීම.
- විනෝදාස්වාදය ලබා දීම.
- ඖෂධ ලබා දීම.
- පරිසරය පවිත්‍ර කිරීම / කුණු කසළ කා දැමීම.
- වගාවන් ආරක්ෂා කිරීමට උදවු වීම.
- පොහොර ලබා දීම.
- මල් පරාගනයට දායක වීම.
- බීජ ව්‍යාප්තියට උදවු වීම.

# <u>මිනිසා මගින් සතුන්ට ලැබෙන දේ</u>

- ආහාර පාන ලබාදීම.
- ඖෂධ ලබා දීම.
- අභයභූමි නිර්මාණය මගින් ආරක්ෂාව සැපයීම.
- බල්ලා,පූසා වැනි සතුන්ට ආදරය කරුණාව ලබා දී රැක බලාගැනීම.
- වාසස්ථාන සාදා දීම.
- පිරිසිදු කිරීම (නෑවීම).
- පලතුරු/ විශාල ගස් රෝපණය කිරීම .

➢ <u>**ගන්නා ආහාර අනුව සතුන් කාණ්ඩ තුනකට වර්ග කළ හැක.**</u>

**1. ශාක භක්ෂක**



**එළුවා**



**ගවයා**



**හාවා**

**2. මාංශ භක්ෂක**



**බත් කූරා**



**පිළිහුඩුවා**



**කොටියා**

## 3. සර්ව භක්ෂක



කුකුළා



කපුටා



බල්ලා

### ➢ සතුන්ට මිනිසාගෙන් සිදුවන අයහපත් බලපෑම්

- ගස් කැපීම/කැලෑ එළිකිරීම
- වැලි ගොඩ දැමීම
- සතුන් දඩයම් කිරීම
- පහත් බිම් ගොඩ කිරීම
- වනාන්තර තුළ අනවශ්‍ය ඉදි කිරීම
- වනාන්තර ගිනි තැබීම
- අවිධිමත් ලෙස කෘමිනාශක, රසායන පොහොර වර්ග භාවිත කිරීම.
- මසුන් ඇල්ලීම සඳහා වැරදි ක්‍රම භාවිතය.

# <u>ශ්‍රී ලංකාවට ආවේණික සතුන්</u>

❖ පක්ෂීන්




වළි කුකුළා



හබන් කුකුළා

❖ ක්ෂීරපායීන්



කළු වඳුරා



කලවැද්දා



හික්මීයා

❖ මත්ස්‍යයින්



බුලත් හපයා



මල් පුලුට්ටා

- ❖ උරගයන්



**යක් කටුස්සා**




**දිය නයා**

## <u>සතුන් ගැන කියවෙන වන්නම්</u>


1. තුරඟා වන්නම (අශ්වයා)
2. මුසලඬි වන්නම (හාවා)
3. මයුරා වන්නම (මොනරා)
4. ගජගා වන්නම (අලියා)
5. නෛයඬි වන්නම (නයා)
6. හනුමා වන්නම (වඳුරා)
7. සැවුලා වන්නම (කුකුළා)

<u>සත්ත්ව අනුකරණ</u>


- හාවා මෙන් පැන පැන යාම.




- දළඹුවා ලෙස ගමන් කිරීම




- ගෙම්බකු සේ පැන පැන යාම




- අශ්ව ගමන




- අලියා සේ ගමන් කිරීම.



- වඳුරකු සේ පැන පැන යාම.



- කකුළුවකු සේ ගමන් කිරීම.



- කූඩැල්ලකු සේ ගමන් කිරීම.

